# සසුනෙහි උපාධ්‍යායන් වහන්සේගේ භූමිකාවෙහි සුවිශේෂී බව

**අක්මීමන ධම්මපාල හිමි**

උපාධ්‍යාය යන වචනාර්ථය සංස්කෘත හා පාලි භාෂාවන්ගෙන් ද ව්‍යවහාර වේ. එය පාලි ''උපජ්ඣාය'' සංස්කෘත ''උපාධ්‍යාය'' වශයෙන් ද සිංහල භාෂාවට ''උපාධ්‍යාය'' යනුවෙන් තත්සම ස්වරූපයෙන් ශබ්ද විද්‍යාත්මකව බිඳී ඇති බව පෙනෙයි. සංස්කෘත භාෂාවෙහි උපාධ්‍යා යන්න ගෞරව අභිධානයක් සේ භාවිත වෙයි. සංස්කෘත ග්‍රන්ථ කර්තෘන් බොහෝ දෙනෙකුගේ නාමයට පසුව උපාධ්‍යාය යන විශේෂණ භාවිත කොට තිබේ. උපාධ්‍යාය යන්නෙහි අර්ථය වේද ආදිය උගන්වන්නා, ශාස්ත්‍ර උගන්වන්නා **(සෝරත හිමි, 2009, 134 පිටුව)** යන්න යි. බෞද්ධ සන්දර්භයේ උපජ්ඣාය යන්න ඊට වෙනස් වූ ස්වරූපයක් දරයි. එනම් උපාධ්‍යායවරයා යනු අවවාද දෙන ගුරුවරයා, භික්ෂූන්ගේ මහණ උපසම්පදා දෙකෙහි ප්‍රධාන වන තෙරුන් වහන්සේ, කුඩු මහත් වරද පෙන්වා චෝදනා කරන්නා, සිහිකරන්නා, **(සිරිසුමංගල හිමි, 1965)** යන්න යි. ඉන් ප්‍රකාශ වන්නේ කිසියම් කෙනෙකු ශික්ෂා මාර්ගයෙහි හික්මවන්නට උත්සාවත් වන මහ තෙරුන් වහන්සේ නමක් හැටියට යි. ගිහි දිවියේ දී කුටුම්භරක්ෂණාදී අදාළ කටයුතුවල නිරත වී සිට පැවිදි දිවියට පත්වූ විගස එකී සාමණේරයා පැවිදි භූමිකාවේ අංග සම්පූර්ණ වශයෙන් නිවැරදි පුද්ගලයෙකු බවට පත් නොවෙයි. එහි දී උපාධ්‍යායන් වහන්සේගේ ආශ්‍රය හා මගපෙන්වීම අත්‍යවශ්‍ය බව ප්‍රකට වේ. තව දුරටත් සාමණේර දිවිය සකස් කළ යුතු ව පවතී. අභිනවයෙන් ප්‍රව්‍රජ්‍යා භූමියට පත්වූ නවක පැවිද්දාට මෙය නිරවද්‍යය මෙය සාවද්‍යය වශයෙන් තෝරා බේරා ගැනීම අපහසු කාර්යකි. මෙය කුඩා වූ වැරැද්දකි. මෙය මහා වැරැද්දකි වශයෙන් ගුරූපදේශයෙහි පිහිටුවා ක්‍රියාත්මක කළ යුතු කාල පරාසයක් ශාසන සම්ප්‍රදායේ දක්වා ඇත. නිරන්තරයෙන් සමීපයෙහි සිටිමින් අවශ්‍ය අනුශාසනා උපදෙස් දෙමින් ශාසන ක්‍රියාවලිවෙහි ධර්ම විනයානුකූල ක්‍රියාදාමයෙහි හික්මවිය යුත්තේ සසුන චිරාත් කාලයක් ආරක්ෂා වීමට ය. එසේ නොවුව හොත් ඕනෑම කෙනෙකුට සිවුරු දරාගත් ගමන්

තම අභිමතයන් ක්‍රියාත්මක කරන්නකු වශයෙන් පෙනී සිටිය හැකි ය. මෙම තත්වය වර්තමානයේ ද උද්ගත වී ඇති නිසා ආචාර්ය උපාධ්‍යයයන් වහන්සේලාගෙන් තොර ව සිවුරු පොරවාගත් ඇතැමුන් තම අභිමතය පරිදි ත්‍රිපිටක දේශනවලට විවිධ අර්ථකතන දෙමින් ශාසනය විකෘති කරන ආකාරය දක්නට ලැබේ. එසේ වූ විට ශාසනය දියුණුව කරා නොව පරිහානිය කරා ගමන් කරයි. බුද්ධ කාලයේ ද මෙබඳු තත්වයක් නිර්මාණය වූ බවට තොරතුරු දක්නට ලැබේ. මේ අනුව සාමණේර දිවියෙහි මූලික වශයෙහ් හික්මවන සොයා බලන ප්‍රතිබලසම්පන්න ස්ථවිරයන් වහන්සේ නමකගේ අවශ්‍යතාව ඇති වන්නට විය. එකී කාර්ය සාධනය සඳහා උපාධ්‍යාය තනතුර අනුදැන වදාරා තිබේ. ''මහණෙනි උපාධ්‍යායවරයකු පත් කර ගැනීම අනුදනිමි. සද්ධිවිහාරිකයා කෙරෙහි උපාධ්‍යායවරයා මොහු මාගේ පුත්‍රයෙකි යන හැඟීම පිහිටුවා ගන්නේ ය. මෙසේ ඔවුනොවුන් කෙරෙහි ගෞරව ඇත්තේ අවවාදයට ඇහුම්කම් දෙමින් සමාන පැවැතුම් අත්තේ මේ ධර්මයෙහි දියුණුවට පැමිණෙත්.'' අනුජානාමි භික්ඛවෙ උපජ්ඣායං උපජ්ඣායො භික්ඛවෙ සද්ධිවිහාරකම්හි පුත්තචිත්තං උපට්ඨපෙස්සති, සද්ධිවිහාරිකො උපජ්ඣායම්හි පිතු චිත්තං උපට්ඨපෙස්සති, එවං තෙ අඤ්ඤමඤ්ඤං සගාරවා සප්පතිස්සා සභගාවුත්තිතො විහරන්තා ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූල්හිං වෙපුල්ලං ආපජ්ජිස්සන්ති,'' **(මහාවග්ගපාළි i, 2005, 94 පිටුව)**. උපාධ්‍යායන්වහන්ගේ ක්‍රියාකලාපයේ කරුණු තුනක් සුවිශේෂ වශයෙන් අවධාරණයට ලක් වේ.

01. අන්‍යොන්‍ය වශයෙන් ගෞරව ඇති බව

02. අන්‍යොන්‍ය පිළිසරණ ඇතිව ක්‍රියාත්මක වන බව

03. ගැලපෙන ආකාරයට ඇවතුම් පැවතුම් ඇති බව

**(මහාවග්ගපාළි i, 94 පිටුව)**

සසුනේ මුල් යුගයේ දී උපාධ්‍යාය තනතුරක් ක්‍රියාත්මක වූයේ නැත. එකල පැවිදිවූවන් තුළ පැවැති ඒකායන අරමුණ වූයේ නිර්වාණ සාක්ෂාත්කරණය පමණි. එකී ලෝකෝත්තර අරමුණ සඳහා ක්‍රියාත්මක වන්නා තුළ උපක්ලේශ ව්‍යුපසමනය සිදු විය යුතුය. ප්‍රථමාභිසම්බෝධි සමයේ දී මේ තත්වය මෙසේ ක්‍රියාත්මක විය. එහෙත් කාලයාගේ ඇවෑමෙන් සසුනේ ආසවට්ඨානීය ධර්මයන්ගේ

පහළ වීම හේතු කොට ගෙන එබඳු සමාජ වපසරියක ක්‍රියාත්මක වූ පුද්ගල මනෝභාවයන් පරිවර්තනයට ලක් විය. මේ අනුව ඓතිහාසික වශයෙන් උපාධ්‍යාය භූමිකාවක් ක්‍රියාත්මක වීම හා උන් වහන්සේ විසින් දැරිය යුතු වගකීම් පිළිබඳ නියමාකරණයක් දැඩිසේ අවශ්‍ය විය. අනුපජ්ඣායක යුගයේ භික්ෂුවගේ සමාජ ක්‍රියාකාරිත්වය ශික්ෂාමාර්ග යට සුදුසු පරිදි සකස් නො වී ය. ''උපාධ්‍යාය තනතුරක් නොමැති යුගයේ භික්ෂූහු මනාකොට හැඳ නොපොරවා ආකල්ප සම්පත්තියෙන් තොරව පිණ්ඩපාතයෙහි හැසිරුණහ. ආහාර පිළිගැනීම අවිධිමත් බව, වැළඳීමෙහි අවිධිමත් බව, පානය කිරීමෙහි අවිධිමත් බව, දන්හලෙහි ක්‍රියාත්මකවීමේ අවිධිමත් බව'' තෙන බො පන සමයෙන භික්ඛු අනුපජ්ඣායකා අනොවදියමානා අනනුසාසියමානා දුන්නිවත්ථා දුප්පාරුතා අනාකප්පසම්පන්නා පිණ්ඩාය චරන්ති. මනුස්සානං භුඤ්ජමානානං උපරිභොජනෙනපි උත්තිට්ඨපත්තං උපනාමෙන්ති, උපරි ඛාදනීයෙපි උපරි භොජනෙනපි උත්තිට්ඨපත්තං උපනාමෙන්ති, උපරි ඛාදනීයෙපි උපරිසායනීයෙපි උත්තිට්ඨපත්තං උපනාමෙන්ති, උපරිපානීයෙපි උත්තිට්ඨපත්තං උපනාමෙන්ති, සාමං සූපම්පි ඔදනම්පි විඤ්ඤාපෙත්වා භුඤ්ජන්ති, භත්තග්ගෙපි උච්චාසද්දා මහාසද්දා විහරන්ති **(මහාවග්ගපාළි i, 2005, 92 පිටුව).**

නිසා ප්‍රසාදජනක නො වී ය. මේ නිසා නිරන්තරයෙන් පොදු මහජනතාවගේ දෝෂ දර්ශනයට ලක් විය. ''මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති'' බුද්ධ කාලයේ දී දක්නට ලැබුණු මෙබඳු සිද්ධීන් හේතුකොට ගෙන නවක භික්ෂුවගේ ශාසනමාමක දිවියට උපාධ්‍යායන් වහන්සේගේ මැදිහත්වීම අත්‍යවශ්‍ය විය.

ශාසන චර්යාවෙහි උපාධ්‍යාය ග්‍රහණය කිරීමය සඳහා අනුදත් ක්‍රමයක් තිබේ. ඒ හැර ස්වාභිමතයට අනුව මාගේ උපාධ්‍යායන් වහන්සේ මූන් වහන්සේ ය යනුවෙන් උපාධ්‍යාය ග්‍රහණය සිදු කිරීමක් සසුනෙහි දක්නට නැත. උත්තරාසංගය ඒකාංස කොට පොරවා උපාධ්‍යයන් වහන්සේ වශයෙන් පිළිගන්නා මහ තෙරුන් වහන්සේගේ දෙපා හිසින් වැඳ උක්කුටියෙන් හිඳ ''උපජ්ඣායො මෙ භන්තෙ හොහි'' යනුවෙන් තෙවාචිකව උපජ්ඣාය ග්‍රහණය සඳහා යාචනය සිදු කළ යුතු ය. එකී ඉල්ලීම පිළිගන්නේ නම් උපාධ්‍යායන් වහන්සේ විසින් ''සාහු හෝ සාධු හෝ ඔපනායිකං හෝ පාසාදිකෙන සම්පාදෙහි

හෝ පතිරූපං (**මහාවග්ගපාළි i, 2005, 92 පිටුව**) යනුවෙන් පිළිගැනීම සිදු කරනු ඇත. වාචසික වශයෙන් නොකියා කායික වශයෙන් ද හැඟවීම ද සිදු කළ හැකිය. මෙසේ උපාධ්‍යායවරයා උපාධ්‍යාය ග්‍රහණය පිළිගත්තේ නම් නවක භික්ෂුව උපාධ්‍යාය ග්‍රහණය සිදු කළේ වෙයි. උපාධ්‍යායන් වහන්සේ පිළිගැනීම සිදු නොකළේ නම් උපාධ්‍යාය ග්‍රහණය සිදු නො වූයේ වෙයි.

සමාජ සන්දර්භයේ උපාධ්‍යාය යන්න යෙදෙන්නේ අභිධානාර්ථයෙන් බව පෙනෙයි. එයට ගිහි පැවිදි විභේදනයක් දක්නට නො ලැබේ. එහි සංඥා නාම භාවිතයක් පමණක් දක්නට ලැබෙයි. බහුල වශයෙන් ඉන්දීය ගත් කර්තෘවරුන් හැඳින්වීම සඳහා උපාධ්‍යාය යන්න යෙදෙන අවස්ථා දක්නට ලැබේ. ''බලදේව උපාධ්‍යාය'' ආදි වශයෙනි. ලාංකේය සමාජයේ උපකුලපති (Vice chancellor) යනාර්ථයෙන් උපාධ්‍යාය හෝ මහෝපාධ්‍යාය යනුවෙන් අර්ථකතනයට ලක් වී ඇත. එහි ඇත්තේ සංඥා නාමයක් පමණි. එහි ශාසනික හා සංස්කෘතිකමය වශයෙන් වගකීමක් අන්තර්ගත නො වෙයි. ඉන් පරිපාලනමය වගකීමක් නොකියවේ යැයි ප්‍රකාශ කළ නොහැකිය.

විනයෙහි උපාධ්‍යාය තනතුර ඉතා බලසම්පන්න ය. විනයේ උපාධ්‍යාය තනතුර විනා මහෝපාධ්‍යාය තනතුරක් හමු නොවෙයි. ථෙර යන්නට මහා යන විශේෂණය එක් කොට මහාථෙර මහාවිහාර හෝ මහතෙර, මහපිරිවෙන, මහානිකාය, මහානායක ආදි වශයෙන් සන්ධි වූවා සේ ම මහෝපාධ්‍යාය යනුවෙන් සන්ධි වී තිබේ. විනය දේශනයේ හමු වන්නේ උපාධ්‍යායවරයා පමණි. බුද්ධ කාලයේ දී සිටි උපාධ්‍යායවරයා පශ්චාත්කාලීන ව කෙසේ මහෝපාධ්‍යාය වූයේ ද යන්න ගවේෂණයට ලක් විය යුතු කාරණයකි. සමහර විට ශාසනයේ ''නිකාය'' යනාදී වශයෙන් සංස්ථා පරිපාලන ව්‍යූහයක් ගොඩනැගීමේ දී පරිපාලනමය පහසුව සඳහා මෙම ධුර භාවිතය බලපාන්නට ඇති බව ඉතිහාසය අධ්‍යායනය කිරීමෙන් පැහැදිලි කළ හැකිය. ''උපජ්ඣාති උපජ්ඣාය, සද්දසමානත්ථො ආකාරන්තො උපජ්ඣාසද්දොති දස්සෙති. උපජ්ඣාය, සද්දො එව වා උපජ්ඣා උපයොගපච්චත්තවචනෙසු ය-කාරලොපං කත්වා එවං වුත්තො කරණවචනාදීසු උපජ්ඣාසද්දස්ස පයොගාභාවාති දට්ඨබ්බං''

**විමතිවිනෝදනී ටීකාව හා විනයාලංකාර ටීකාවේ** මේ අදහස දක්වා ඇත්තේ උපජ්ඣා යන පදයට 'ය'කාරාගමයෙන් උපජ්ඣාය වූ බව යි.

විනයේ උපාධ්‍යායවරයාගේ භූමිකාව පිතෘ භූමිකාව යි. එහි අර්ථ කෙතෙක් දුරට ප්‍රායෝගිකව භාවිත වන්නේ ද යන්න පිළිබඳ වර්තමාන ශාසනයේ ප්‍රශ්නාර්ථයක් ඉතිරි වී ඇති බව පෙනෙයි. ඇතැම්විට මේවා සටන් පාඨ පමණක් වී ඇත. බොහෝ සෙයින් සිදු වන්නේ උපාධ්‍යාය තනතුර පිළිබඳ කතිකාවක දී උන් වහන්සේ පිතු චිත්තයෙන් සද්ධිවිහාරිකයා පිළිබඳ ව කටයුතු කළ යුතු බව යි. බොහෝ වගකීම් සහිත සංස්කෘතික, ආගමික හා සමාජ භූමිකාවන්ට වාච්‍යර්ථ දීමට වර්තමාන සමාජය සමත් වී ඇති බව පෙනී යයි. විනයෙහි උපාධ්‍යයවරයා අවස්ථා හතරක දී හමුවෙයි.

01. පබ්බජ්ජාචාර්ය

02. උපසම්පදාචාර්ය

03. ධම්මාචාර්ය

04. නිස්සයාචාර්ය **(සමන්තපාදිකා, 1916, 737)**

මෙසේ දක්වා ඇත්තේ අවස්ථා හතරක් වූව ද මෙහි වගකීම අතිශය බරපතල ය. විනයට අනුරූපී ව ක්‍රියාත්මක වීම මෙහි අත්‍යාවශ්‍ය කාරණය යි. විනය ක්‍රියාත්මකකරණයේ දී කාලය, සමාජය, තාක්‍ෂණය, පහසුකම්, රට, යුගය යනාදී කිසිවක් බලනොපායි. ගං දියට වැටුණ භික්‍ෂුව ගසා ගෙන යද්දී දිවි ගලවාගන්නට තණ කොළ ගසක එල්ලී සිට එයත් අත්හලේ දුකුලාවක් සිදු විය හැකි බැවිනි. දිවි පරදුවට තබා විනය නයෙහි භික්‍ෂුව ක්‍රියාත්මක විය යුතු බව පෙළ පරිශීලනයෙන් උගත හැකි පාඩම යි. පැවිද්දේ දී ආචාර්ය තනතුර භාරගන්නේ පැවිදි ශිෂ්‍යයාට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරන අදහසිනි. එහි දී ආචාර්යවරයා ''පතිරූපං'' යනුවෙන් ප්‍රකාශ කරන්නේ එකී වගකීම තමා භාරගත්තා යන්න හැඟවීමට යි. එකී ආචාර්ය භූමිකාවේ වගකීම් හා ඒවා නිසි සේ ක්‍රියාත්මක කිරීමට නම් ප්‍රතිබලසම්පන්න භික්‍ෂුවක විසින් ම මෙම ආචාර්ය පදවිය භාරගත යුතු බව බුද්ධ නියමය යි. එය උපසම්පදාවේ දී ද එසේ ම ක්‍රියාත්මක වෙයි. ධර්ම උද්ග්‍රහණ, ධාරණ, සජ්ඣායන, සුත, ධ්‍යාන, සමාපත්ති, මගඵල ආදි අවස්ථාවන්හි දී

ක්‍රියාත්මක කරන්නේ ධර්මාචාර්යවරයා ය. නවක උපසම්පදාවට පත් වූ භික්ෂුව නිස්සය ග්‍රහණය කිරීමේ දී නිස දීම, නිස විචාරීම, නිස සමාදන් කරවීම, නිස ප්‍රත්‍යවේක්ෂණය කිරීම ආදි ක්‍රියාවන්හි දී ප්‍රමුඛ ව කටයුතු කරන්නේ නිස්සයාචාර්යන් වහන්සේ ය.

උපාධ්‍යාය යනු සසුනෙහි ප්‍රතිබල සම්පන්න භික්ෂුවකට හිමිවිය යුතු තනතුරකි. මෙහි දී වැදගත් වන්නේ ප්‍රතිබල සම්පන්න යනුවෙන් අර්ථවත් වන්නේ කුමක් ද යන්න යි. එය **මහාවග්ගපාළියෙහි** දක්නට ලැබෙන්නේ ''ව්‍යත්තෙන පටිබලසම්පන්නෙන'' යනුවෙනි. ව්‍යක්ත නම් මුළු විනය පිටකය අටුවා සහිතව වාචෝද්ග්‍රහණය කර තිබීම යි. එසේ නොමැති නම් යටත් පිරිසෙන් ඤත්තිචතුත්ථකම්ම උපසම්පදා වාක්‍ය හෝ කටපාඩම්ව තිබීම යි. ව්‍යක්තෙන භික්ඛුනා පටිබලෙනාති එත්ථ ව්‍යත්තො නාම යස්ස සාට්ඨකතං විනය පිටකං වාචුග්ගතං පවත්තති. තස්මිං අසති යස්ස අන්තමසො ඉදං ඤත්තිචතුත්ථකම්මවාචාමත්තම්පි සුග්ගහීතං හොති. වාචුග්ගතං පවත්තති. තස්මිං අයම්පි ඉමස්මිං අත්ථෙ ව්‍යත්තො **(සමන්තපාසාදිකා තතිය භාගය, 1916, 734).** කර්මාචාර්යවරයා වශයෙන් ක්‍රියාත්මක වන්නා ද එකී කාර්යයේ දී ප්‍රතිබලසම්පන්න නොවීමට බලපාන හේතු කීපයක් විනයෙහි දක්වා ඇත. කාශශ්වාසශ්ලේශ ආදියෙන් ගිලන් වීම. ඕෂ්ට දන්ත ජිව්හා ආදියෙහි අසම්පත්තිය. පර්යාප්ති ධර්ම පුරුදු පුහුණු නොකිරීම. පද ඛ්‍යඤ්ජනානුකූල ව කර්ම වාක්‍ය දේශනා කිරීමට අසමත්වීම, සංවෘත විවෘත භේදය පිළිබඳ නොදැනීම යනාදිය යි. මේ අනුව, දේශනා කළ යුත්ත වෙනත් ආකාරයකට දේශනා කිරීම නිසා කර්මාචාර්යවරයා ද ප්‍රතිබලසම්පන්නයකු නො වෙයි. යො පන කාසසාසසෙම්හාදිනා වා ගෙලඤ්ඤෙන ඔට්ඨදන්තජිව්හාදීනං වා අසම්පත්තියා පරියත්තියං වා අකතපරිචයත්තා න සක්කොති පරිමණ්ඩෙලෙහි පදඛ්‍යඤ්ජනෙහි කම්ම වාචං සාවෙතුං ඛ්‍යඤ්ජනං වා පදං වා හාපෙති අඤ්ඤථා වා වත්තබ්බං අඤ්ඤථා වදති අයං අප්පටිබලො **(සමන්තපාසාදිකා තතිය භාගය, 1916, 734).** කර්ම වාක්‍ය ප්‍රකාශනයේ දී සැලකිය යුතු ප්‍රධාන ම කාරණයක් වන්නේ උච්චාරණය සුද්ධිය නිවැරදි වීම යි. එයින් උපසම්පදාපේක්ෂකයාගේ සුතනිරවද්‍යතාව ඇති විය යුතු ය. මෙසේ සුතනිරවද්‍යතාව ඇති වීමට නම් නිවැරදි ලෙස කර්ම වාක්‍ය උච්ඡාරණය කළ යුතු ය. මේ අන්දමින් දේශනා නොකරන කර්මාචාර්යවරයා ප්‍රතිබලසම්පන්නයකු නො වේ. එයින් ප්‍රකාශ

වන්නේ උපසම්පදාව සිද්ධියට පත්නොවන බව යි. **විනයාලංකාර ටීකාවේ** දී ප්‍රතිබලසම්පන්න භික්ෂුවගේ අවශ්‍ය බව කියවෙන අවස්ථාවල දී දක්නට ලැබෙන්නේ 'පටිබලං එකං භික්ඛුං' යනුවෙනි. ''එකං ව්‍යත්තං පටිබලං භික්ඛුං සඞ්ඝෙන සම්මන්නාපෙත්වා තෙන ධම්මජ්ඣසෙකෙන පාතිමොක්ඛුද්දෙසකං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා උක්කුටිකං නිසීදිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො'' භික්ෂුණීන්ගේ විනයකර්මාදී කටයුතුවල දී ද ප්‍රතිබලසම්පන්න භික්ෂුණියකගේ අවශ්‍ය බව **චුල්ලවග්ගයේ** භික්ඛුණික්ඛන්ධකයේ දී මෙසේ දක්වා ඇත. ''තෙන ඛො පන සමයෙන සබ්බො භික්ඛුණිසඞ්ඝො පවාරෙන්තො කොලාහලං අකාසි. භගවතො එතමත්ථං ආරොචෙසුං. අනුජානාමි, භික්ඛවෙ, එකං භික්ඛුණිං ව්‍යත්තං පටිබලං සම්මන්නිතුං භික්ඛුණිසඞ්ඝස්ස අත්ථාය භික්ඛුසඞ්ඝං පවාරෙතුං. එවඤ්ච පන, භික්ඛවෙ, සම්මන්නිතබ්බා. පඨමං භික්ඛුණී යාචිතබ්බා, යාචිත්වා බ්‍යත්තාය භික්ඛුණියා පටිබලාය සඞ්ඝො ඤාපෙතබ්බො'' ඉන් පැහැදිලි වන්නේ ප්‍රතිබල සම්පන්න භික්ෂුවක් යනු රහසේ සකල ආපත්තීන්හි වැඩ හිඳ ස්වකීය සාපත්තික බව ප්‍රකට නොකරන්නා නො වේ. ආපත්තීන්ට අදාළ පිළියම් සිදු කර ගැනීමට උත්සහවත් නොවන්නා නො වේ. ප්‍රතිබලසම්පන්නයා යනු හුදෙක් අනාපත්තික භික්ෂුව හෝ උත්සාහයෙන් යුක්ත ව ආපත්තිය ශුද්ධ කරගන්නා භික්ෂුව යි. උන් වහන්සේ සැබැවින් ම අනාපත්තිකර ය. උන් වහන්සේගේ පැවිද්ද හා උපසම්පදා සිද්ධියට පත්වී ඇත. උන් වහන්සේ කාය සාමග්‍රිය විනය කර්ම සිද්ධියට පත්වීමට හේතු වේ.

උපාධ්‍යාය තනතුර යනු විනයට අනුව යාවජීවික තනතුරක් නොවන බව පෙනේ. උපාධ්‍යායන් වහන්සේලා වශයෙන් ස්ථිර වශයෙන් සම්මත කොට තෝරා පත් කර ගැනීමක් අතීතයේ දී සිදු නො වූ බවට කරුණු හමු වේ. එහෙත් පශ්චාත් කාලීන ව සංඝ සමාජය සංස්ථාපිත ක්‍රමවේදයකට අනුව සකස් වූ කල්හි එහි පැවැත්මට මෙබඳු තනතුරු පත්කිරීම අවශ්‍ය වූ බව පැහැදිලි වේ.

උපාධ්‍යායවරයා පත් කර ගැනීමේ දී ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය කතිකාවතට අනුව සමසතළිසක් වස් අවශ්‍ය බව නිර්දේශිත ය. වස් ප්‍රමාණය සංස්ථාපිත අවශ්‍යතාවයක් වුව ද එය පෙළ හා අටුවාවට අනුව එකම නිර්ණායකය හැටියට සැලකිය නො හැකි ය.

එහි දී වස් ප්‍රමාණය ඇති ඕනෑ ම ප්‍රතිබලසම්පන්න මහාස්ථවිරයන් වහන්සේ නමකට වුව ද එම වැදගත් ශාසනික තනතුරට පත්විය හැකි බැවිනි. උන් වහන්සේ විනය නය දන්නා අයෙකු වීමත් විනයෙහි ක්‍රියාත්මක වන්නෙකු වීමත් මෙහි ඇති වැදගත් ම කාරණය යි. ඤත්ති චතුත්ථකම්මෝපසම්පදාවේ මූලාසනයෙහි ක්‍රියාත්මක වන උපාධ්‍යායවරයා උපසම්පදාව සිද්ධියට පත්වීමට බෙහෙවින් බලපායි. තනතුරෙන් උපාධ්‍යාය වුවත් විනය ශික්ෂා ගරුකත්වය නිසා ස්වකීය ක්‍රියාකාරකම හීන නම් මෙහිදී අඩුපාඩුකම් සිදුවිය හැකි ය.

දළ්හීකම්මෝසම්පදාවේ දී උපාධ්‍යායවරයෙකු පත්කරගැනීම අවශ්‍ය නො වේ. එහි දී සිදු වන්නේ කලින් උපසම්පදාවේ දී ක්‍රියාත්මක වූ උපාධ්‍යායවරයා සිහිපත් කර ගැනීම යි. දළ්හීකර්ම උපසම්පදාවේ දී ද සිදු වන්නේ ද උපසම්පදා කර්ම වාක්‍ය නැවත දේශනා කිරීම යි. මෙහි දී කර්ම වාක්‍ය දේශනා කිරීමේ දී ''තිස්සස්ස උපසම්පදාපෙක්ඛො'' යන්න වෙනුවට ''තෙනෙව උපජ්ඣායෙන....'' වශයෙන් ආදේශ කොට දේශනා කිරීම සිදු වේ.

බුද්ධ කාලයේ ඇතැම් විට උපාධ්‍යායවරයෙකුගෙන් තොර ව උපසම්පදා සිදු කළ අවස්ථා පිළිබඳ ව මහාවග්ගයේ කරුණු හමුවේ. එහි දී බුදුරජාණන් වහන්සේ වදාළේ උපාධ්‍යායවරයෙකුගෙන් තොර ව උපසම්පදාව සිද්ධියට පත්නොවන බව නො වේ. කාරක සංඝයාට දුක්කටාපත්තියක් සිදු වන බව පමණි. තෙන ඛො පන සමයෙන භික්ඛූ අනුපජ්ඣායකං උපසම්පාදෙන්ති භගවතො එතමත්ථං ආරොචෙසුං. න භික්ඛවෙ අනුපජ්ඣායකො උපසම්පාදෙතබ්බො යො උපමස්පාදෙය්‍ය ආපත්ති දුක්කටස්ස **(මහාවග්ගපාළි i, බුද්ධ ජයන්ති මුද්‍රණ 2005, 222 පිටුව)**. සමන්තපාසාදිකාව මීට අර්ථකතන සපයමින් පවසන්නේ උපාධ්‍යායන් නොගෙන, උපාධ්‍යායන්ගෙන් විරහිත ව උපසම්පදා වූවෝ ධර්මයෙන් හෝ ආමිසයෙන් සංග්‍රහ නො ලබති. ඔවුන් පිරිහෙත්. නො වැඩෙත්. එහෙත් ඇතැම් ආචාර්යවරු මෙසේ පවසති. උපාධ්‍යායවරයෙකුගෙන් තොර ව යනු උපාධ්‍යායවරයෙකු නොගෙන උපසම්පදාවක් සිදු කිරීම නො වේ. ශික්ෂාපද පැනවූ තැන් පටන් මෙසේ උපසම්පදා කරන්නවුනට ආපත්ති වේ. කර්මය කෝප්‍ය නො වේ. ඇතැම්හු කෝප්‍ය වේ යැයි කියත්. සිද්ධියට පත් වේ යැයි කියත්. එය නොගත යුතු ය. 'අනුපජ්ඣායකං'ති උපජ්ඣං අගාහාපෙත්වා

සබ්බෙන සබ්බං උපජ්ඣාය විරහිතං, එවං උපසම්පන්නා නෙව ධම්මතො න ආමිසතො සංගහං ලභන්ති. තෙ පරිහායන්තියෙව න වඩ්ඪන්ති. 'න භික්ඛවෙ අනුපජ්ඣායකො'ති උපජ්ඣං අගාහාපෙත්වා නිරුපජ්ඣායකො න උපසම්පාදෙතබ්බො, 'ආපත්ති දුක්කටස්සා'ති සික්ඛාපද පඤ්ඤත්තියො පට්ඨාය එවං උපසම්පාදෙන්තස්ස ආපත්ති, කම්මං න කුප්පති. කෙචි කුප්පතීති වදන්ති. තං න ගහෙතබ්බං. **(සමන්තපාසාදිකා තතිය භාගය, 1916, 765)** යනුවෙනි.

සංස්ථාව සුරැකීමට උපාධ්‍යාය හෝ මහෝපාධ්‍යාය තනතුරු පත්කිරීම අවශ්‍ය වේ. එහෙත් එකී තනතුරේ ගුණාත්මක අගය පවත්වාගැනීමට සුදුසු මහතෙරුන් වහන්සේලා ඊට පත්වීම වඩාත් වැදගත් වේ. උන් වහන්සේ චෝදනා පරෝපවාද විරහිත විනය නය දන්නා සීල වෘද්ධ, ගුණ වෘද්ධ, තපෝ වෘද්ධ උපසම්පදාව ආරක්ෂා කර ගත් දස වස් සපිරි භික්ෂුවක් විය යුතු යි. යාවජීව උපාධ්‍යාය තනතුරක් පිළිබඳ සඳහනක් විනය හා තදනුගත අට්ඨකථාවල දක්නට නැත. සාසනයේ ජීවය උපසම්පදාව යි. උපසම්පදාව සජීවී වන්නේ උපාධ්‍යායවරයා මත යි. උපාධ්‍යායවරයාගේ පිතෘ භූමිකාව බුදුරදුන්ගේ ප්‍රශංසාවට ලක්වූවකි. එය බුදුරදුන් ආඥා මුඛයෙන් සිදු කළ දේශනයකි. එය ඉවතළා දැමිය නොහැකි පාටිපාටිගත චර්යා පද්ධතියකි. බුදුරදුන් දේශනා කළේ උපාධ්‍යාය හා සද්ධිවිහාරික යුගලයෙහි සුසංයෝග යෙන් සසුන් පිළිවෙත සංවර්ධනය වන බව යි. මේ නිසා ආරාමික දිවිය සාර්ථක වෙයි. වර්තමාන ආරාමික සංස්කෘතියේ ගැටලු ප්‍රශ්න ඇතිවීමෙහි ප්‍රබල සාධකයක් වන්නේ උපාධ්‍යාය හා සද්ධිවිහාරික යන දෙදෙනාගේ මනෝභාවයන් ය. ආරාමයේ සද්ධිවිහාරිකයා යනු උපාධ්‍යාය ග්‍රහණයෙහි ධම්ම විනය පුරුදු පුහුණු වන්නා ය. එහෙත් ඔහු නිදහස් ව නිවහල් ව සංවර්ධනය විය යුතු ය. උපාධ්‍යායන් වහන්සේ කෙරෙහි තමාගේ පියා වශයෙන් සලකා ආචාර සමාචාර වෘද්ධොපචාරයෙහි යෙදිය යුතු යි. ''සද්ධිවිහාරිකෙන, භික්ඛවෙ, උපජ්ඣායම්හි සම්මා වත්තතබ්බං'' වත්පිළිවෙත් සිදු කිරීම මැනවින් කළ යුතු යි.

උදේම අවදි වී පාවහන් මුදා උතුරු සළුව ඒකාංශ කොට පොරවා දැහැටි දඬු පිරිනැමීම

මුව ධොවන වතුර දීම

ආසන පැනවීම

භාජනය පිරිසිදු කොට කැඳ වේනම් පිළිගැන්වීම

පරිභෝජිත භාජය පිරිසිදු කොට මුනින් නමා තැබීම

උපාධ්‍යායන් වහන්සේ නැගී සිටි කල්හි ආසන අකුලා තැබීම

ස්ථානය අපිරිසිදු නම් පිරිසිදු කිරීම

ආරාමයෙන් බැහැර වන්නේ නම් අන්තරාවාසකය දීම හා ඇඳ සිටි අන්තරාවාසකය පිළිගැනීම.

කාලස්සෙව වුට්ඨාය උපාහනා ඔමුඤ්චිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා දන්තකට්ඨං දාතබ්බං, මුඛොදකං දාතබ්බං, ආසනං පඤ්ඤපෙතබ්බං. සචෙ යාගු හොති, භාජනං ධොවිත්වා යාගු උපනාමෙතබ්බා. යාගුං පීතස්ස උදකං දත්වා භාජනං පටිග්ගහෙත්වා නීචං කත්වා සාධුකං අප්පටිසංඝසන්තෙන ධොවිත්වා පටිසාමෙතබ්බං. උපජ්ඣායම්හි වුට්ඨිතෙ ආසනං උද්ධරිතබ්බං. සචෙ සො දෙසො උක්ලාපො හොති, සො දෙසො සම්මජ්ජිතබ්බො. සචෙ උපජ්ඣායො ගාමං පවිසිතුකාමො හොති, නිවාසනං දාතබ්බං, පටිනිවාසනං පටිග්ගහෙතබ්බං, කායබන්ධනං දාතබ්බං, සගුණං කත්වා සඞ්ඝාටියො දාතබ්බා, ධොවිත්වා පත්තො ස උදකො දාතබ්බො. සචෙ උපජ්ඣායො පච්ඡාසමණං ආකඞ්ඛති, තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණං කත්වා සඞ්ඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා ධොවිත්වා පත්තං ගහෙත්වා උපජ්ඣායස්ස පච්ඡාසමණෙන හොතබ්බං. නාතිදූරෙ ගන්තබ්බං, නාච්චාසන්නෙ ගන්තබ්බං, පත්තපරියාපන්නං පටිග්ගහෙතබ්බං. න උපජ්ඣායස්ස භණමානස්ස අන්තරන්තරා කථා ඔපාතෙතබ්බා. උපජ්ඣායො ආපත්තිසාමන්තා භණමානො නිවාරෙතබ්බො **(මහාවග්ගපාළි i, 96).**

මේවා උපජ්ඣාය වත්ත වශයෙන් සාසන ව්‍යාවහාරයෙහි ක්‍රියාත්මක විය යුතු අංග වේ. ඒවායේ ඇති වන්නේ අන්‍යෝන්‍ය බැඳීම සහ ගෞරවය යි. එයින් ආරාමික පරිසරය ප්‍රියමනාප තැනක් බවට පත් වෙයි. උපාධ්‍යාය සද්ධිවිහාරික සබැඳියාව නිසා ශාසනික

වශයෙන් පිය පුත් සබඳතාව දෙදරා නො යයි. කිසියම් ආකාරයට උපාධ්‍යායවරයාගේ සිතේ නොසන්සුන් බවක් ඇති වී නම් එහි දී පවා සද්ධිවිහාරිකයා කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳ ව බුදුරදුන් දේශනා කොට තිබේ. ඉදින් උපාධ්‍යායවරයාට ශාසනය කෙරෙහි නොඇල්මක් උපන්නේ නම් සද්ධිවිහාරිකායා උපාධ්‍යායන් වහන්සේ වෙනත් තැනකට ගෙන යා යුතු යි. එසේ නැතිනම් වෙනත් මහතෙරුන් වහන්සේ නමක් අමතා 'ස්වාමීනි අපේ උපාධ්‍යායන් වහන්සේ වෙනත් තැනකට ගෙන යනු මැනවි.' යි කිව යුතුයි. උපාධ්‍යායවරයා ගරු ඇවතකට පත් වූයේ නම් සද්ධිවිහාරිකයා විසින් පිරිවෙස් පිරීමට උත්සාහවත් කළ යුතු යි. උපාධ්‍යායවරයාට පිරිවෙස් දීමට සංඝයා උනන්දු කරවිය යුතු යි. සචෙ උපජ්ඣායස්ස අනභිරති උප්පන්නා හොති, සද්ධිවිහාරිකෙන වූපකාසෙතබ්බො, ධම්මකථා වාස්ස කාතබ්බා. සචෙ උපජ්ඣායස්ස කුක්කුච්චං උප්පන්නං හොති, සද්ධිවිහාරිකෙන විනොදෙතබ්බං, විනොදාපෙතබ්බං, ධම්මකථා වාස්ස කාතබ්බා. සචෙ උපජ්ඣායස්ස දිට්ඨිගතං උප්පන්නං හොති, සද්ධිවිහාරිකෙන විවෙචෙතබ්බං, විවෙචාපෙතබ්බං, ධම්මකථා වාස්ස කාතබ්බා, සචෙ උපජ්ඣායො ගරුධම්මං අජ්ඣාපන්නො හොති පරිවාසා රහො, සද්ධිවිහාරිකෙන උස්සුක්කං කාතබ්බං, 'කින්නු බො සංඝො උපජ්ඣායස්ස පරිවාසං දදෙය්‍ය. **(මහාවග්ගපාලි i, බු. ජ. ත්‍රි. මු, 2005, 102).**

සද්ධිවිහාරිකයාගේ විසින් උපාධ්‍යායන්වහන්සේ රැක ගැනීමට ක්‍රියාත්මක විය යුතු ආකාරය මෙයින් මනාකොට දක්වා තිබේ. උන් වහන්සේ මූලායපටිකස්සනයට සුදුසු වූයේ නම් ඒ සඳහා අවශ්‍ය පිළියම කිරීමට ද උත්සාහවත් විය යුතු ය. සචෙ උපජ්ඣායො ගරුධම්මං අජ්ඣාපන්නෝ හොති පරිවාසාරහො සද්ධිවිහාරිකෙත උස්සුක්කං කාතබ්බං... සචෙ උපජ්ඣායො මූලායපටිකස්සනාරහො හොති සද්ධිවිහාරිකෙත උස්සුක්කං කාතබ්බං. කින්ති නු බො සඞ්ඝො උපජ්ඣායං මූලාය පටිකස්සෙය්‍යාති? **(එම, 102).** මානත් අවශ්‍ය නම් මානත ද සුදුසු අවස්ථාවේ දී අබ්භාහනය ද කර විය යුතු ය. යම් හෙයකින් භික්ෂු ගණයා විසින් නිස්සය කර්ම, තජ්ජනීය කර්ම, පබ්බාජනීය කර්ම, උක්ඛෙපනීය කර්ම උපාධ්‍යායන්ට සිදු කරන්නට සැරසෙත් නම් එය ලඝු කරවා ගැනීමට හෝ සද්ධිවිහාරිකයා උත්සාහවත් විය යුතු ය. සචෙ උපජ්ඣායො මානත්තාරහො

හොති, සද්ධිවිහාරිකෙන උස්සුක්කං කාතබ්බං - කින්ති නු ඛො සඞ්ඝො උපජ්ඣායස්ස මානත්තං දදෙය්‍යාති. සචෙ උපජ්ඣායො අබ්භානාරහො හොති, සද්ධිවිහාරිකෙන උස්සුක්කං කාතබ්බං කින්ති නු ඛො සඞ්ඝො උපජ්ඣායං අබ්භෙය්‍යාති. සචෙ සඞ්ඝො උපජ්ඣායස්ස කම්මං කත්තුකාමො හොති තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා, සද්ධිවිහාරිකෙන උස්සුක්කං කාතබ්බං කින්ති නු ඛො සඞ්ඝො උපජ්ඣායස්ස කම්මං න කරෙය්‍ය ලහුකාය වා පරිණාමෙය්‍යාති. කතං වා පනස්ස හොති සඞ්ඝෙන කම්මං තජ්ජනීයං වා නියස්සං වා පබ්බාජනීයං වා පටිසාරණීයං වා උක්ඛෙපනීයං වා, සද්ධිවිහාරිකෙන උස්සුක්කං කාතබ්බං **(මහාවග්ගපාලි i, බු. ජ. ත්‍රි. මු, 2005, 102).**

උපාධ්‍යායවරයා සද්ධිවිහාරිකයා කෙරෙහි ද පෙරළා මනාකොට පැවතිය යුතු ය. එනම්, විමසීමෙන් අවවාද අනුශාසනා කිරීමෙන් සංග්‍රහ කළ යුතු ය.

> සද්ධිවිහාරිකයාට අවශ්‍ය කරන පාත්‍රා සිවුරු පරිෂ්කාරාදිය ඔහුට කෙසේ ලැබෙන්නේ ද යන කාරණය පිළිබඳ ව විමසිය යුතු යි. ඒවා ලබා දීමට උත්සාහවත් විය යුතු යි.
>
> සද්ධිවිහාරිකයා ගිලන් වූ විට අවශ්‍ය උවටැන් සිදු කළ යුතු යි.
>
> උපාධ්‍යායවරයා කෙරෙහි සද්ධිවිහාරිකයා පිළිපදින්නේ යම් සේ ද සද්ධිවිහාරිකයා ගිලන් වූ විට උපාධ්‍යායවරයා ඔහු කෙරෙහි ඒ සියලු ආකාරයෙන් වත් පිළිවෙත් දැක්විය යුතු යි. **(එම, පි. 106 -114).**

මෙමගින් පැහැදිලි වන්නේ උපාධ්‍යාය හා සද්ධිවිහාරික සබැඳියාව විනයානුකූ මාවතක් ඔස්සේ හැර වෙනත් මාවතක් එකී සබැඳියාව නිර්මාණය වන්නට ඉඩක් නොමැති බව යි. සෑම පියවරක් ම නිර්මාණය වී ඇත්තේ ප්‍රතිෂ්ඨාපනය වී ඇත්තේ විනය මත වීම මෙහි ඇති වැදගත් ම කාරණය වෙයි. මෙහි සුවිශේෂීත්වය නම් උපාධ්‍යායවරයාට ස්වකීය සද්ධිවිහාරිකයා වෙනුවෙන් උක්තව දක්වන ආකාරයට කටයුතු කිරීමේ අවසර ද විනය **මහාවග්ගපාළියේ** දී ලබා දී තිබීම යි. සාසන පිළිවෙත හුදෙක් ආරාමික සංස්ථාගත දියුණුව නොව මානසික වූ පාරිශුද්ධත්වය යි. මෙම ප්‍රස්තුතයෙහි ලා සැළකූ විට

**මහවග්ගපාළියේ** උපාධ්‍යාය සද්ධිවිහාරික වත් තුළ නොගැළපේයයි කියා ඉවත දා හැකි එකදු වචනයක්වත් නැත. **ධම්මපදට්ඨකථාවේ** එන සංඝරක්ඛිතභාගිනෙය්‍ය වස්තුවේ දී උපාධ්‍යායවරයා කෙරෙහි සද්ධිවිහාරිකායා පවතින ආකාරය ආදර්ශ සම්පන්න ය.

උපාධ්‍යයවරයාගේ බලසම්පන්න බව ප්‍රකට වන්නේ නවක උපසම්පන්නයාට නිස සමාදන් කරවීමෙනි. නිස යනුවෙන් අදහස් කරන්නේ පැවිද්දෙකු විසින් සිහියෙන් යුතුව ක්‍රියාත්මක විය යුතු කරුණු හතරක් පිළිබඳව යි. ''නිස්සයා නං වසතීති නිස්සයො'' **(විනයාලංකාරටීකා, 98 පිටුව).** නිස්සය ධර්ම භික්ෂූන්ට දේශනා කරන්නට හේතු වූයේ රජගහනුවර බමුණෙකු පැවිදි උපසම්පදාවීමෙන් පසු පිණ්ඩපාතය යෑමේ මැළිබවක් දැක්වීම නිසා ය. පිණ්ඩපාත චාරිකාව උන් වහන්සේ ප්‍රතික්ෂේප කළහ. පිණ්ඩපාතය යාමට සිදුවන්නේ නම් තමා උපැවිදි වන බව ද වැඩි දුරටත් ප්‍රකාශ කළේ ය. එම බ්‍රාහ්මණ භික්ෂුව ප්‍රකාශ කළේ තමා කෑම සඳහා පැවිදි වූ බව යි. **(මහාවග්ගපාලි i, 2005, 124 පිටුව).** මේ හේතුව නිසා සතර නිස්සය ධර්ම භික්ෂුවට අනුදැන වදාරා තිබේ. ''අනුජානාමි, භික්ඛවෙ, උපසම්පාදෙන්තෙන චත්තාරො නිස්සයෙ ආචික්ඛිතුං'' **(මහාවග්ගපාලි i, 2005, 124).**

01. පිණ්ඩියාලොපභොජනං නිස්සාය පබ්බජ්ජා

02. පංසුකූලචීවරං නිස්සාය පබ්බජ්ජා

03. රුක්ඛමූලසෙනාසනං නිස්සාය පබ්බජ්ජා

04. පූතිමුත්තභෙසජ්ජං නිස්සාය පබ්බජ්ජා

**(මහාවග්ගපාලි i, 2005, 126).**

මෙම නිස්සය සමාදානයේ දී උපාධ්‍යාය ග්‍රහණයෙන් සිදු කළ යුතු යි. එය නිස ගැනීම වශයෙන් සසුන් ව්‍යවහාරයෙහි සඳහන්වෙයි. නිසි දීම සඳහා සුදුසු උපධ්‍යායවරයා අවම වශයෙන් වස් දහයක්වත් සපිරි ප්‍රතිබලසම්පන්න භික්ෂුවක් වීම බුද්ධ නියමය යි. ''අනුජානාමි භික්ඛවෙ ව්‍යක්තෙන භික්ඛුනා පටිබලෙන දසවස්සෙන වා අතිරෙක දසවස්සෙන වා උපසම්පාදෙතුං නිස්සයං දාතුං'' **(මහාවග්ගපාලි i, 2005, 154).** වශයෙන් මේ කාරණය දැක්වේ. නිස දීමට හැකිවන්නේ වස් දහයක් හෝ අතිරෙක දස වසක් ඇති ව්‍යක්ත ප්‍රතිබලසම්පන්න

භික්ෂූන් වහන්සේට පමණි. උන් වහන්සේ නිස දීම පිළිබඳ උපාධ්‍යාය වෙයි. එය කෙතරම් බලසම්පන්න ද යන්න දැක්වෙන්නේ, ආචාර්යයන් වහන්සේ සමීපයේ නිස සමාදන් වූ සද්ධිවිහාරිකයා එකම ආරාමයේ චෛත්‍යය වන්දනා කරන්නේ එකම ග්‍රාමයෙහි පිඬු පිණිස හැසිරෙන්නේ උපාධ්‍යායන් වහන්සේ දකින්නේ ද එවිට ආචාර්යවරයා වෙත සමාදන් වී සිටි නිස සංසිඳේ. මාර්ගයට පිළිපන්නේ හෝ අහසින් වැඩම කරන්නේ දුරතියාම දැක මේ මාගේ උපාධ්‍යායවරයා යැයි හඳුනාගන්නේ ද එසේත් නැතිනම් උපාධ්‍යායවරයා ධර්ම දේශනා කරන හඬ ඇත සිට අසා මේ මාගේ උපාධ්‍යායවරයා යැයි හඳුනා ගන්නේ ද එවිට ආචාර්යවරයා වෙත සමාදන් වී සිටි නිස සංසිඳේ. **සමන්තපාසාදිකාවේ** සඳහන් උක්ත විග්‍රහයට අනුව ශාසනයේ උපාධ්‍යාය තනතුරේ ප්‍රබලත්වය ප්‍රකට වේ.

සසුනෙහි ඉතා බලවත් වූ තනතුරක් හැටියට උපාධ්‍යාය තනතුර හඳුන්වා දීමට පුළුවන. එබැවින් උපාධ්‍යාය තනතුර හිමිවිය යුත්තේ ව්‍යක්ත ප්‍රතිබලසම්පන්න මහතෙරුන් වහන්සේ නමකට පමණි. උන් වහන්සේ විශේෂයෙන් විනයෙහි ක්‍රියාත්මක වන්නෙකු විය යුතු ය. විනය නය දත්තෙකු විය යුතු ය. මේ අනුව උපාධ්‍යාය තනතුරේ ස්වභාවය වටහා ගත හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

සෝරත හිමි, වැලිවිටියේ, (2009). **සංස්කෘත ශබ්දාර්ණවය**, (ප්‍රථම භාගය) ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.

සිරිසුමංගල හිමි මඩිතියවල, (1965). **පාලි සිංහල ශබ්ද කෝෂය,**

**මහාවග්ගපාළි i, බුද්ධ ජයන්ති මුද්‍රණ (2005).**

**සමන්තපාදිකා, හේවාවිතාරණ මුද්‍රණ (1916).**

**විනයාලංකාරටීකා.**

**සමන්තපාසාදිකා තතිය භාගය,** (1916). හේවාවිතාරණ මුද්‍රණය